# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/08 - 2023 අගෝස්තු මස 29 වැනි අඟහරුවාදා - 2023.08.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2023 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. 2023 ජූනි මස 14 දිනැති අංක 2336/45 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2023 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, ඒ යටතේ සිදු කරනු ලැබූ කිසිදු ක්‍රියාවක වලංගුභාවයට අගතියක් නොවන සේ මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

3. ඉහත රෙගුලාසි අංක 2 හි සඳහන් 2023 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි මගින් 2023 ජූනි 14 සිට 2023 අගෝස්තු 28 දක්වා කාලය තුළ නියාමනය කරන ලද ඕනෑම භාණ්ඩයක්/භාණ්ඩ තොගයක්, 2023 අගෝස්තු මස 29 සිට බලපැවැත්වෙන පරිදි, ආනයන පාලන බලපත්‍රයක් ඉල්ලීමකින් තොරව රේගු ආඥාපනතේ විධිවිධාන ප්‍රකාරව මුදා හැරීමට ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට මෙයින් බලය පවරනු ලැබේ.

4. මෙම රෙගුලාසි 2023 අගෝස්තු මස 29 දින සිට බලාත්මක වේ.

EOG 09-0042

1A - PG 6471 — 376 (2023/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*